Sinhalese

කොරෝනා වයිරස් (කෝවිඩ්-19)

# කෝවිඩ්-19 පරීක්ෂාව

## කා විසින් පරීක්ෂාකර ගත යුතුද?

උණ හෝ සෙම්ප්‍රතිශ්‍යාව සහිත රෝග ලක්ෂණ ඇති ඕනෑම අයෙකු, රෝග ලක්ෂණ කොතරම් අඩුවුවද, හැකි විගස කෝවිඩ්-19 සම්බන්ධ පරීක්ෂණයක් කරගත යුතුය. කෝවිඩ්-19 රෝග ලක්ෂණ අතර පහත ඒවා ඇත:

- උණ උදා. සීතල, රාත්‍රියේදී දහදිය දැමීම
- කැස්ස, උගුරේ ආසාදන, උගුර කැසීම, නාසයෙන් සොටු ගැලීම, හුස්ම කෙටිවීම, සුවඳ හෝ රසදැනීම අඩුවීම ආදී ශ්වසන රෝග ලක්ෂණ
- මාංශ පේශි රුදාව, හන්දිපත් රුදාව, පාචනය, ඔක්කාරය/වමනය සහ කෑම අරුචිය ආදී වෙනත් රෝග ලක්ෂණ

## ඔබව පරීක්ෂාකල පසු කුමක් බලාපොරොත්තුවේද?

- පරීක්ෂා කිරීම නොමිළේය
- ඔබව පරීක්ෂණ සායනයක් වෙත යොමුකර ඇතිනම්, කරුණාකර ඔබගේ යොමු කිරීමේ ලිපිය රැගෙන යන්න. බොහෝ සායන සඳහා මෙය අවශ්‍ය නැත.
- පරීක්ෂණ සහ ශ්වසන සායනවල සිටින කාර්ය මණ්ඩල විසින් මුව ආවරණ, ගවුම්, අත් වැසුම් සහ මුව ආවරණය කරන උපකරණ පළදිනු ඇත.
- ඔබගේ රෝග ලක්ෂණ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල විසින් විමසනු ඇත.
- ඔබගේ නාසය ඇතුලතින් සහ උගුරෙන් සාම්පල ලබාගනු ඇත.

## මාව පරීක්ෂා කල පසු කුමක් සිදුවේද?

- ඔබගේ පරීක්ෂණ ප්‍රතිඵල ලැබෙන තෙක් සහ සුවවන තෙක්, ඔබ නිවසේ රැඳී සිටිය යුතුය (ස්වයං හුදෙකලාවීම).
- ඔබ විසින් වෛද්‍ය රැකවරණය හෝ ආපදා තත්වයක නොසිටිනම්, ඔබගේ නිවසින් පිටතට යා නොහැක. ඔබව බැලීමට අමුත්තන් හට පැමිණිය නොහැක.
- ඔබගේ රෝග ලක්ෂණ දරුණු අතට හැරේ නම් (උදා. හුස්ම ගැනීමේ අපහසුව), බිංදු තුන (000) අමතන්න. ඔබව කෝවිඩ්-19 සඳහා පරීක්ෂාකර ඇති බව ගිලන් රථ කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙන්න.
- ඔබගේ නිවසේ වෙනත් අය ජීවත්වේ නම්, ඔබ වෙනමම කාමරයක සිටිය යුතුය. ඔබ එකම කාමරයේ සිටින විට, ශල්‍ය මුව ආවරණයක් පළඳින්න, එසේම මීටර 1.5 ක දුරින් සිටින්න.
- යහපත් සනීපාරක්ෂක ක්‍රම පුරුදු වන්න. නිතර ඔබගේ අත් සෝදා ගන්න. ඔබගේ කැස්ස හෝ කිවිසුම් වැලමිට හෝ ටිෂූ ආධාරයෙන් ආවරණය කර ගන්න.

## ස්වයං හුදෙකලාවීම සම්බන්ධ වැඩිදුර විස්තර ලබා ගත හැක්කේ කොහින්ද?

https://www.health.nsw.gov.au/Infectious/covid-19/Pages/resources.aspx

- ඔබ කෝවිඩ්-19 රෝගය ඇති අයෙකු සමඟ සමීප සම්බන්ධතාවයක් පැවැත්වූයේ නම්, ඔබ අවසාන වශයෙන් එම පුද්ගලයා දුටු දින සිට දින 14 ක් නිවසේ රැඳී සිටිය යුතුය (සමීප සම්බන්ධතාවය යනු, කෝවිඩ්-19 ආසාදනයවුණු අයෙකු සමඟ ඔවුන් අසනීපවීමට පෙර පැය 48 ක කාලයක් ඇතුලත එකම නිවසේ ජීවත්වීම, මුහුණට මුහුණලා මිනිත්තු 15 කට වැඩි කාලයක් සිටීම හෝ සංවෘත ස්ථානයක පැය 2 ක් සිටීම)
- ඔබ දැනට සුවෙන් සිටියද, පරීක්ෂණයක් මගින් ඔබට රෝගය නැති බව නිර්ණය කලද, සියළුම සම්බන්ධවූ අය හට නිවසේ හුදකලාවීම අදාලවේ.

## මාගේ පරීක්ෂණ ප්‍රතිඵල ලබා ගන්නේ කෙසේද?

- ඔබට සාමාන්‍යයෙන් ප්‍රතිඵල පැය 24 සිට 48 ක කාලයක් තුල ලැබුණද, පැය 72 ක කාලයක් ලබා දෙන්න.
- ඔබගේ පරීක්ෂාව ආපදා ඒකකයක හෝ රජයේ රෝහලක කෝවිඩ්-19 සායනයක සිදුකල අතර, රෝග වියාධි කෝවිඩ්-19 එස්.එම්.එස්. ප්‍රතිඵල සේවාව සමඟ ලියාපදිංචිවී ඇතිනම්, ඔබගේ කෝවිඩ්-19 ඍණ ප්‍රතිඵල එස්.එම්.එස්. මගින් ලබාගත හැකිය. ඔබ ඒ සඳහා ලියාපදිංචිවී නැතිනම්, ඔබගේ පළාත් සෞඛ්‍යය දිස්ත්‍රික් මහජන සෞඛ්‍යය නිලධාරීන් වෙතින් දුරකථන ඇමතුමක් ලැබෙනු ඇත.
- ඔබගේ වෛද්‍යවරයා හෝ වෙනත් ස්ථානයක ඔබගේ පරීක්ෂාව සිදුකලේනම්, ඔබගේ වෛද්‍යවරයා විසින් ඔබගේ ප්‍රතිඵල ලබාදෙනු ඇත.

## මට රෝගය ඇති බවට පරීක්ෂණයෙන් සනාථවුනිනම්, කුමක් සිදුවේද?

- නිව් සවුත් වේල්ස් හෙල්ත් මගින් ඔබව බලා ගනු ඇත. ඔබට මෙඩිකෙයාර් නැතිවුවද, ඔබට වියදමක් යන්නේ නැත.

NSW GOVERNMENT

# කෝවිඩ්-19 පරීක්ෂාව

## මා හට පරීක්ෂාකර ගත හැක්කේ කොහින්ද?

- කෝවිඩ්-19 සායනයක් වෙත යන්නඃ https://www.health.nsw.gov.au/Infectious/covid-19/Pages/clinics.aspx නැතිනම්
- ඔබගේ වෛද්‍යවරයා අමතන්න

## නිව් සවුත් වේල්ස් හෙල්ත් කෝවිඩ්-19 පරීක්ෂණ සායන ස්ථාන:

| නගරය | ස්ථානය | විවෘතව තබන වෙලාවන් | දුරකථනය | යොමු කිරීමක් අවශ්‍යද? |
| --- | --- | --- | --- | --- |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

© NSW Health June 2020. SHPN (HP NSW) 200310